# මාධ්‍ය සටහන

## කාර්තුගත දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තු
## 2010 පළමු වැනි කාර්තුව

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
ශ්‍රී ලංකාව

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ස්ථාවර (2002) හා පවත්නා මිල යටතේ ඇස්තමේන්තු කරන ලද 2010 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ දළ දේශීය නිෂ්පාදනය මෙයින් ප්‍රකාශයට පත් කෙරේ.**

ශ්‍රී ලංකා ආර්ථිකයේ සමස්ත නිෂ්පාදනය මනිනු ලබන දළ දේශීය නිෂ්පාදිතය (දදේනි) ස්ථාවර (2002) මිල යටතේ 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ (ජනවාරි - මාර්තු) පැවති රුපියල් මිලියන 601,084 සිට 2010 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ රුපියල් මිලියන 643,539 දක්වා ඉහළ යමින් සියයට 7.1ක වර්ධනයක් පෙන්විය. කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා යන ආර්ථිකයේ ප්‍රධාන අංශ තුන 2009 පළමුවැනි කාර්තුවට සාපේක්ෂව 2010 පළමු වැනි කාර්තුවේ දී පිළිවෙලින් සියයට 9.0, 6.9 හා 6.7කින් වර්ධනය විය. ප්‍රධාන අංශවල උප අංශ අතර, තේ (සියයට 47.2), රබර් (සියයට 11.7), සුළු අපනයන බෝග (සියයට 118.2), ඉදිකිරීම් (සියයට 8.5), හෝටල් හා ආපනශාලා (සියයට 61.0), ප්‍රවාහනය හා සන්නිවේදනය (සියයට 10.4)ක් ලෙස ඉහළ වර්ධනයක් පෙන්විය.

දළ දේශීය නිෂ්පාදිතයට කෘෂිකර්මාන්ත, කර්මාන්ත හා සේවා අංශවල දායකත්වය බොහෝ දුරට නොවෙනස්ව පිළිවෙලින් සියයට 13.8, 28.4 හා 57.8ක් ලෙස පැවතිණි.

දළ දේශීය නිෂ්පාදියේ අවධමනකය (2002=100) 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ පැවති දර්ශකාංක 191.7 සිට 2010 පළමු වැනි කාර්තුවේදී දර්ශකාංක 213.2 දක්වා ඉහළ ගොස් උද්ධමන අනුපාතය සියයට 11.2ක් ලෙස වාර්තා විය.

පාරිභෝගික භාණ්ඩ හා සේවාවල සාමාන්‍ය මිල මට්ටම පිළිබිඹු කෙරෙන කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2002=100), 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ පැවති දර්ශකාංක 202.7 සිට 2010 පළමු වැනි කාර්තුවේදී 216.0 දක්වා ඉහළ යමින් උද්ධමන අනුපාතය සියයට 6.6ක් ලෙස සටහන් විය. 2009 පළමුවැනි කාර්තුවේ එම උද්ධමන අනුපාතය සියයට 7.8ක් විය.

## කෘෂිකර්මාන්ත අංශය

කෘෂිකර්මාන්ත, වන හා ධීවර අංශය 2010 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ සියයට 9.0කින් වර්ධනය විය. මෙම අංශයේ 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේදී සියයට 3.6ක වර්ධනයක් පැවතිණි.

2010 පළමු වැනි කාර්තුවේ තේ නිෂ්පාදනය එකතු කළ අගය සියයට 47.2කින් වර්ධනය විය. ලෝක ආර්ථික පසුබැසීමෙහි හා වියළි කාලගුණයෙහි අහිතකර බලපෑමෙන් 2009 පළමු වැනි කාර්තුවේදී සියයට 39.7කින් පසුබෑ මෙම අංශය යථා තත්ත්වයට පත්වීම 2010 පළමු වැනි කාර්තුවේ වර්ධනයෙන් පෙන්නුම් කෙරේ.

රබර් නිෂ්පාදනය එකතු කල අගය 2010 පළමුවැනි කාර්තුවේදී සියයට 11.7කින් වර්ධනය වූ අතර, 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ වර්ධනය සියයට 2.6ක් ලෙස පහළ අගයක විය. 2009 වර්ෂයේ පළමුවැනි කාර්තුවේ දී රුපියල් 132.17ක් වූ කොළඹ වෙන්දේසියේ රබර් කිලෝ එකක සාමාන්‍ය මිල 2010 පළමු වැනි කාර්තුවේදී රුපියල් 321.24 දක්වා සියයට 143.1කින් ඉහළ ගියේය. මෙම කාලය තුළ රබර් මිල ක්‍රමයෙන් ඉහළයාමෙන්, රබර් වගා නඩත්තු කටයුතුවල හා කිරි කැපීමේ කටයුතුවල ඇති වූ ප්‍රගතිය 2010 පළමු වැනි කාර්තුවේ යහපත් වර්ධනයට හේතු විය.

පොල් නිෂ්පාදනය එකතු කල අගය 2010 පළමුවැනි කාර්තුවේදී සියයට 14.4ක පසුබෑමක් පෙන්විය. පසුගිය වසරේ පළමු වැනි කාර්තුවේ මෙම අංශයේ සියයට 15.1ක වර්ධනයක් පැවතිණි. 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවට බලපෑ වියළි කාලගුණය හා එම කාර්තුවේ පැවති ඉහළ නිෂ්පාදන පදනම හේතුවෙන් මෙම කාර්තුවෙහි පොල් නිෂ්පාදනයේ පසුබැසීමක් පිළිබිඹු විය.

2010 පළමු වැනි කාර්තුවේ සුළු අපනයන බෝග නිෂ්පාදනය එකතු කල අගය සියයට 118.2කින් වර්ධනය විය. පසුගිය වසරේ පළමු වැනි කාර්තුවේ මෙම අංශයේ සියයට 5.3ක පසුබැසීමක් වාර්තා විය.

ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වන බත සපයන, වී නිෂ්පාදනය එකතු කල අගය 2010 වසරේ පළමු වැනි කාර්තුවේ සියයට 8.9ක වර්ධනයක් වාර්තා කල අතර, එය 2009 වසරේ පළමු වැනි කාර්තුවේ සියයට 12.2ක වර්ධනයක් පෙන්විය. 1952 සිට 2009 දක්වා මහ කන්නයේ පැවති ඉහළම වී නිෂ්පාදනය 2008/2009 මහ කන්නයේ දී බුසල් මිලියන 114.3ක් ලෙස වාර්තා විය. එය තව දුරටත් ඉහළ යමින් 2009/2010 මහ කන්නයේ දී බුසල් මිලියන 124.5 දක්වා වැඩි විය. නැගෙනහිර පළාතේ හා මන්නාරම සහ යාපනය යන දිස්ත්‍රික්කවල වී නිෂ්පාදනය පිළිවෙලින් සියයට 10.6, 65.1 හා 13.8කින් ඉහළ ගියේය. වී නිෂ්පාදනයේ මෙම සැලකිය යුතු වර්ධනයට සාමය උදාවීම, යහපත් කාලගුණ තත්වයන් හා රජයේ අඛණ්ඩ පොහොර සහනාධාර ප්‍රධාන වී ඇත.

2010 පළමු වැනි කාර්තුවේ සත්ත්ව නිෂ්පාදනය එකතු කල අගය සියයට 4.7කින් වර්ධනය විය. 2009 පළමු වැනි කාර්තුවේ කිරි ලීටර් මිලියන 42.7ක් ව පැවති කිරි නිෂ්පාදනය 2010 පළමු වැනි කාර්තුවේදී ලීටර් මිලියන 48.9 දක්වා ඉහළ ගියේය. ගොඩනැගුණු සාමකාමී වාතාවරණය සත්ත්ව පාලන කටයුතුවල වර්ධනයට හේතු වූ අතර, විශේෂයෙන්, පැවති අයහපත් වාතාවරණයට වසර ගණනාවක් නිරාවරණය වූ නැගෙනහිර, උතුරු මැද පළාත්වල හා මොණරාගල දිස්ත්‍රික්කයේ කිරි එකතු කිරීමේ කටයුතුවල ඉහළ ප්‍රගතියක් ඇති විය.

2010 පළමු වැනි කාර්තුවේ දී ගොඩගොවිතැන් බෝග උප අංශයෙහි නිෂ්පාදනවල එකතු කළ අගය සියයට 5.3කින් වර්ධනය විය. මෙහි බඩඉරිඟු, රතු ලූණු හා අර්තාපල් නිෂ්පාදන පිළිවෙලින් සියයට 9.0, 58.7 හා 7.5කින් ඉහළ ගියේය.

2010 පළමු වැනි කාර්තුවේදී එළවළු නිෂ්පාදනය උප අංශය එකතු කළ අගය සියයට 5.6කින් වර්ධනය විය. මෙම වර්ධනයට උඩරට එළවළු නිෂ්පාදනයේ ඉහළ වර්ධනය හා ගෙවතු ආශ්‍රිත එළවළු වගාවේ ප්‍රසාරණය හේතු විය.

2010 වර්ෂයේ පළමුවැනි කාර්තුවේ සමස්ත ධීවර නිෂ්පාදනය එකතු කළ අගය සියයට 3.7කින් වර්ධනය විය. ඒ තුළ මිරිදිය ධීවර නිෂ්පාදනය සියයට 0.6කින් ද කරදිය ධීවර නිෂ්පාදනය සියයට 4.2කින් ද වර්ධනය විය. 2009 වර්ෂයේ පැවති වියළි කාලගුණය හේතුවෙන් ජලාශවල ජල මට්ටම දැඩි ලෙස පහළ යාම මිරිදිය ධීවර නිෂ්පාදනයේ වර්ධනයට අහිතකර විය. සාගර කාලගුණයෙහි වෙනස්වීම් කරදිය ධීවර නිෂ්පාදනයේ වර්ධනයට යම් පමණක බාධාවක් වුව ද, මසුන් මැරීමේ කාල සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම එම අංශයේ වර්ධනයට හිතකර විය. උතුරු හා නැගෙනහිර පළාත්වල කරදිය ධීවර නිෂ්පාදනය පිළිවෙලින් සියයට 122.4කින් හා 82.4කින් වර්ධනය වී ඇත. උතුර හා නැගෙනහිර හැර අනෙක් ප්‍රදේශවල සමස්ත කරදිය ධීවර නිෂ්පාදනයෙහි සියයට 27.7ක පසුබෑමක් පෙන්විය.

## කර්මාන්ත අංශය

කර්මාන්ත අංශය 2010 පළමු වැනි කාර්තුවේදී සියයට 6.9 වර්ධනයක් ලබා ඇත. මෙම අංශය 2009 පළමු වැනි කාර්තුවේදී සියයට 1.9කින් වර්ධනය විය. කර්මාන්ත අංශයේ විශාලතම උප අංශය වන නිෂ්පාදන කර්මාන්ත අංශය සියයට 5.8කින් වර්ධනය විය.

2010 පළමු වැනි කාර්තුවේ මැණික් අපනයන වටිනාකම සියයට 27.9කින් වැඩි වී ඇත.

කර්මාන්තශාලා නිෂ්පාදන උප අංශය සියයට 5.4කින් වර්ධනය විය. මේ යටතේ වන ආහාර හා පාන වර්ග උප අංශය සියයට 6.8කින් වර්ධනය විය. රෙදිපිළි, ඇඟලුම් හා සම්භාණ්ඩ නිෂ්පාදන උප අංශයේ වර්ධනය සියයට 0.8ක් විය.

විදුලිය ගෑස් සහ ජලය උප අංශය 2010 පළමු වැනි කාර්තුවේදී සියයට 6.4කින් වර්ධනය විය. සමස්ත විදුලිබල නිෂ්පාදනය සියයට 10.1කින් ඉහළ ගියේය. ජල විදුලි බල ජනනය සියයට 58.5කින් වැඩි වූ අතර තාප විදුලි බල ජනනය සියයට 7.8කින් අඩු විය.

පසුගිය වසරේ පළමු කාර්තුවේ සියයට 3.0ක මූර්ත වර්ධනයක් පැවති ඉදිකිරීම් උප අංශය 2010 වසරේ පළමු වැනි කාර්තුවේ සියයට 8.5කින් වර්ධනය විය. මෙම වර්ධනයට මහ පරිමාණ සංවර්ධන නව ව්‍යාපෘති ආරම්භ කිරීම හා ආරම්භ කර තිබූ මහ පරිමාණ සංවර්ධන ව්‍යාපෘතිවල දැනටමත් කෙරිගෙන යන ඉදිකිරීම් කටයුතු හේතු විය.

වාණිජ බැංකු විසින් නිවාස, ගොඩනැගිලි හා ව්‍යාපාර ස්ථාන ආදිය ඉදිකිරීමට දෙන ලද ණය ප්‍රමාණය මෙම කාර්තුවේදී සියයට 1.5ක වැඩිවීමක් පෙන්වයි. 2009 පළමු වැනි කාර්තුවේ සියයට 15.6කින් පහළ ගිය මුළු සිමෙන්ති නිෂ්පාදනය මෙම වර්ෂයේ පළමු වැනි කාර්තුවේ සියයට 11.6කින් වැඩි විය.

## සේවා අංශය

තොග සහ සිල්ලර වෙළෙඳාම, හෝටල් හා ආපනශාලා, ප්‍රවාහන හා සන්නිවේදන අංශ යථා තත්ත්වයට පත්වීම හේතුවෙන්, 2010 පළමු වැනි කාර්තුවේදී සේවා අංශයේ සියයට 6.7ක ඉහළ වර්ධනයක් වාර්තා විය. පෙර වර්ෂයේ පළමු වැනි කාර්තුවේ එහි වර්ධනය සියයට 1.0ක් ලෙස අඩු අගයක පැවතිණ.

අපනයන පරිමාවේ සිදු වූ අඩුවීම නිසා අපනයන වෙළෙඳාම් අංශය සියයට 4.0කින් පසු බැස ඇත. අපනයන ආදායම, 2009 වර්ෂයේ පළමුවැනි කාර්තුවේ එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.) මිලියන 1,647 සිට 2010 වර්ෂයේ පළමු වැනි කාර්තුව වන විට එ.ජ.ඩො. මිලියන 1,764 දක්වා සියයට 7.1කින් වැඩි විය.

ආනයන වෙළෙඳාම් අංශය මෙම කාර්තුව තුළ සියයට 5.8කින් වර්ධනය විය. ආනයන වියදම, 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ සිට 2010 පළමු වැනි කාර්තුව වන විට එ.ජ.ඩො. මිලියන 2,312 සිට 3,225 දක්වා සියයට 39.5කින් ඉහළ ගොස් ඇත. 2009 වර්ෂයේ පළමු වැනි කාර්තුවේ ආනයන වියදමෙහි සියයට 30.3ක අඩුවීමක් වාර්තා විය.

2009 පළමු වැනි කාර්තුවේදී 3.8කින් පමණක් වර්ධනය වූ දේශීය වෙළෙඳාම් උප අංශය 2010 පළමු වැනි කාර්තුවේ සියයට 8.3කින් වර්ධනය විය.

2009 පළමු වැනි කාර්තුවේදී සියයට 16.7කින් පසුබෑමට ලක් වූ හෝටල් හා ආපනශාලා උප අංශය 2010 පළමු වැනි කාර්තුව තුළ සියයට 61.0ක ඉහළ වර්ධනයක් පෙන්විය. මෙම ආකර්ශනීය වර්ධනයට රට පුරා පැවති සාමකාමී වාතාවරණය මෙන්ම, ලෝක ආර්ථික පසුබෑසීම එක්තරා ප්‍රමාණයකට නිමාවෙමින් පැවතීම හේතු විය. සංචාරකයන්ගේ පැමිණීම 2009 පළමු වැනි කාර්තුවේ 106,702 වූ අතර එය 2010 පළමු වැනි කාර්තුවේ 160,409 දක්වා සියයට 50.3කින් වැඩි විය. මෙම කාලය තුළ සංචාරක ඉපයීම් සියයට 70.2කින් ද කාමර ධාරිතා උපයෝජන අනුපාතය (Room Occupancy Rate) 41.6 සිට 78.4 දක්වා ද ඉහළ ගියේය.

ප්‍රවාහන හා සන්නිවේදන උප අංශය 2010 පළමු වැනි කාර්තුවේ දී සියයට 10.4ක වර්ධනයක් පෙන්නුම් කළේය. මෙම අංශයේ 2009 පළමු වැනි කාර්තුවේදී සියයට 3.9ක වර්ධනයක් පැවතිණි. මගී හා භාණ්ඩ ප්‍රවාහනය, වරාය හා සිවිල් ගුවන් සේවා, තැපැල් හා විදුලි සන්දේශ යන උප අංශ සේවා අංශයේ වර්ධනය ඉහළ නැංවීමට දායක විය.

ලෝක ආර්ථික පසුබැසීම හමුවේ මන්දගාමීව පැවති ජාත්‍යන්තර වෙළෙඳාම යථා තත්ත්වයට පත්වීම පෙන්නුම් කරමින්, වරාය හා සිවිල් ගුවන් සේවා උප අංශය 2010 පළමු වැනි කාර්තුවේ දී සියයට 20.0කින් වර්ධනය විය. මෙම කාලය තුළ වරාය අධිකාරිය මෙහෙයවන ලද භාණ්ඩ ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) සියයට 40.5කින් ද ශ්‍රී ලංකන් ගුවන් සේවයේ බහලුම් ප්‍රමාණය සියයට 11.0කින් ද වැඩි වී ඇත.

2010 පළමු වැනි කාර්තුව තුළ අලුතින් ලියාපදිංචි කරන ලද වාහන සංඛ්‍යාවේ මුළු වැඩිවීම සියයට 56.5කි. මෙහි පෙර වර්ෂයේ පළමු වැනි කාර්තුවේ සියයට 30.5ක අඩු වීමක් වාර්තා විය.

පොලී අනුපාතය අඩුකිරීම හේතුවෙන් වාණිජ බැංකුවල පොලී ආදායම් අඩු වූ අතර, තැන්පතු පොලී අනුපාතය පහළ යාම හේතුවෙන් තැම්පතු සඳහා පොලී ගෙවීම් අඩු විය. මේ හේතුවෙන් බොහෝ බැංකුවල ශුද්ධ පොලී ආදායම ඉහළ යාමෙන් සමස්ත බැංකු පද්ධතියේ ලාභය ද ඉහළ ගියේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික ගිණුම් අංශය.

දුරකතනː- 094-011-2687108, 094-011-2676345, ෆැක්ස්:–094-011-2676572, ඊ-මේල්:–national.accounts@statistics.gov.lk, අන්තර්ජාලය www.statistics.gov.lk